# සිංහල සිනමාවේ පුරහඳ බැසයයි!



මහා නළු ජෝ අබේවික්‍රම



පියදාස පලන්සූරියගේ සිරිබෝ අයියා නම් නව කථාව මහාචාර්‍ය සුනිල් ආරියරත්න ඒ නමින්ම සිනමාවට නැගීය. මේ එහි ජෝ සහ වසන්ති චතුරානි පෙනී සිටින රූප රාමුවක්



ජෝ පුරහඳ කලුවර චිත්‍රපටයේ



පුංචි බබා චිත්‍රපටයේ ජෝ අබේවික්‍රම සහ මාලිනී ෆොන්සේකා

**සිං**හළ සිනමා ක්ෂේත්‍රය කාන්තාරයක් වන්නට නොදී එයට තෙතමනය සහ හාත් පස පැතුරුණු සෙවනක් දෙමින් ආරක්ෂා කළ මහා වෘක්ෂයක් හෙවත් වනස්පතියක් පසු ගිය මස අගදී ඉදිරී වැටුණි. ලාංකීය සිනමාව ජාත්‍යන්තර ගණයට ඔසවා තබන්නට උචිතවන අයුරින් අපටම ආවේණික රංගන කලාවක් අප රටට දායාද කර දුන් ජෝ අබේවික්‍රම නම් මහා සිනමා ශිල්පියාණෝ මෙලොවින් සමුගෙන ගියහ. ඒ මොහොත වන විට ඔහු 78 වියේ පසුවිය.

ජෝ උපත ලද්දේ 1933 ජුනි මස 14 වෙනි දින රත්නපුර දිස්ත්‍රික්කයේ ලෙල්ලෝපිටිය නම් ග්‍රාමයේ හතර දෙනෙකු ගෙන් යුත් පවුලක වැඩිමලා වශයෙනි. උප්පැන්න සහතිකයේ නම සඳහන් වන්නේ ගම්මන පටබැඳිගේ දොන් ජෝන් අබේවික්‍රම යනුවෙනි. දෙමාපියෝ ඔහු ඉගෙනුම පිණිස රත්නපුරේ සීවලී මහා විද්‍යාලයට ඇතුළ් කළෝය.

පාසැලෙන් අස්වී කාර්යාලයන්හි කුඩා ලිපිකාර රැකියාවල් කීපයක් කළ ජෝට **දේව සුන්දරී** නම් ඉන්දියාවේ නිශ්පාදනය කළ සිංහළ චිත්‍රපටයක සුළු චරිතයක් රඟපාන්නට ලැබිණ. එහෙත් ඒ චිත්‍රපටය සම්පූර්ණයෙන් තැනුණේ නැත. කිසි දිනක තිරයට ආවේ ද නැත. එහෙත් එය එක් දෙයක් කළේය. එනම් මේ තරුණයාගේ සිතෙහි සිනමාව කෙරෙහි ඇල්මක් ඇතිකිරීම ය. ඒ කාලේ රත්නපුරේ තිබුණේ එකම එක සිනමා හලකි. වතු ජනතාව නිසා ඉන්දියානු දෙමළ චිත්‍රපටි ද, ඇමරිකානු කව්බෝයි චිත්‍රපට ද එහි නිතර තිරගත විය. ජෝන් වේන් ලා, මාලන් බ්‍රැන්ඩෝ ලා ආදීන්ගේ රඟපෑම් දුටු අබේවික්‍රම තරුණයා සිනමාව වෙතට තවත් ඇදී ගියේය.

1957 දී **සරදම්** චිත්‍රපටයේ ඔහුට විකට චරිතයක් රඟපාන්නට ලැබුණි. සිනමා නළුවෙකු ලෙස අප රටේ ජනතාව ජෝ හඳුනාගත්තේ ඒ රඟපෑමෙනි. ඒ චිත්‍රපටයේ අධ්‍යක්ෂකවරයා ඇතැම් විට ජෝන් යයි නොකියා ජෝ කියා ඔහු ට කතා කළේ ය. ජෝ යන්න වඩා හොඳ බව ඔහුට ද වැටහී ගියේය. ජෝන් අබේවික්‍රම එයින් පසු මුළු ලංකාවට ම ජෝ අබේවික්‍රම නම් වීය.

අඩසිය වසක කාලයක් පුරා ඔහු රඟපා ඇති චිත්‍රපට සංඛ්‍යාව **150** ට අධික ය. ඒ අතරින් චණ්ඩියා, වැලිකතර, භාරලක්ෂය, තුංමං හන්දිය, බඹරු ඇවිත්, දැස නිසා, වැලිකතර, සාරවිට, බැද්දේගම, සොල්දාදු උන්නැහේ, දඬුමොණර ආදී චිත්‍රපටවල ඔහු දැක්වූ විශිෂ්ඨ ගණයේ රඟපෑම් අපේ සිංහළ සිනමාව ලෝක සිනමා මට්ටමට ඔසවා තබන්නට සමත් වූ බව පැහැදිලි සත්‍යයකි.

සිංහළ සිනමාවේ නිම් වළලු පසුකර මින් අද්වීතීය තැනක් හිමිකරගත් මේ මහා රංගධරයා ජනාධිපති සම්මාන, සරසවි සම්මාන, ඕසීඅයිසී සම්මාන, සුමති සම්මාන ස්වර්ණ සංඛ ආදී සම්මාන රැසකින් ගෞරවයට පාත්‍රවිය.

චිත්‍රපටවලට අමතරව වේදිකාවද ඔහු හුරුකර ගත්තේය. මල් යහනාව, බැරිසිල් කැලෑමල් සහ ඔතෙලෝ ඔහු රඟපෑ වේදිකා නාට්‍ය වන අතර, ගම්පෙරළිය, අඳුකොළ, තුන්බිය, වනස්පති, ඉමිදිය මං කඩ, සකිසඳ එළි යස් හා ඇසළ කළුවර ආදිය ජෝ රංගනයෙන් දායක වුණු ටෙලි නාට්‍යයෝ වෙති.

ඔහු සිනමාවට පිවිසි යුගයේ අධ්‍යක්ෂකවරු ඔහු දෙස බැලූයේ ප්‍රසන්න සිතකින් නොවේ. ජෝ ඔහුම කියන පරිදි ආරෝහ පරිනාහ දේහ සම්පත්තිය හෙවත් උස මහත සිරුරකින් හෙබි පුරුෂයෙකු නොවූයේය. එසේම ඔහු සතුව තිබුණේ එකල සිනමාවට යෝග්‍ය සුන්දර මුහුණක් ද නොවේ. ඒ බව සමහරු ඔහුගේ මුහුණටම කියා ඇත. එහෙත් ඕනෑම චරිතයකට ආරූඪ වී, ඒ පුද්ගලයා බවට නිමේශයකින් පත්වන්නට අපූර්ව හැකියාවක් ඔහුට සහජයෙන් ම ලැබී තිබුණි. ඔහු අනෙක් සියල්ලන් අභිබවා මහා රංගධරයෙකු වූයේ ඒ නිසාය. එසේම ඔහු වයස් ගතවත්මය ඔහුගේ හොඳම රඟපෑම් මතුවන්නට වූයේ. ජෝ පණදුන් චරිත දෙස බලන කල එය අපට මැනවින් පෙනේ. මේ කිසිවක් ඔහු ඉගෙන ගත්තේ සිනමාව පිළිබඳ පොත පත කියවා හෝ, විදේශීය සිනමා ඇකඩමිවල රඟපෑම් ශිල්ප හදාරා හෝ නොවේ. රත්නපුරේ ගැමි දිවිපෙවෙත තුළ ඒ සියළු දේ කැටි වී තිබිණ. ඒ ගමේකම ඔහුට පිටිවහලක් වූයේ ඔහු ගතින් හදවතින් අවංකවම ගැමියෙකු වූ නිසා ය.

සිරිබෝ අයියා හි - සිරිබොහාමි, බඹරු ඇවිත් හි - ඇන්ටන් මුදලාලි, සාරවිටෙහි - සාරයියා, තුංමං හන්දියේ - අබිලින් දැස නිසා හි- නිරුදක, වැලිකතරේ- ගෝරිං, සිරිපාල හා රන්මැණිකා හි- සිමන් මුදලාලි, බැද්දේගමේ - සිළිඳු, මේ ආදී එකිනෙකට වෙනස් චරිතවලට ජෝ පණ දෙද්දී ඒ චරිත ඒවා හිමි පුද්ගලයින්ම මිස, මේ මෙතැන ඉන්නේ ජෝ අබේවික්‍රම නමැති නළුවාය කියා ප්‍රේක්ෂක අපට යාන්තම් වත් නොහැඟුණේ ඒ ඔහුගේ චරිතාරූඪ වීමේ සුවිශේෂ වූ හැකියාව නිසා ය.

සිය දිගු සිනමා ගමනේදී ජෝ අබේවික්‍රමයන් ප්‍රතිනිර්මාණය කළ චරිත තිබුණේ කොහිද? සිනමාහලේ රිදී තිරයේ නොවේ. කුඩා ගම්වලය, ජනයා ගැවසෙන මහා මාර්ගවලය, මුහුදු වෙරළ වැල්ලේය. මේ මෑතක ඔහු ශ්‍රී ලංකාවේ පුවත්පතකට දුන් සාකච්ඡාවකින් මේ සියල්ල අනාවරණය වේ.

" රත්නපුරේ ලෙල්ලෝපිටිය නම් මගේ ගමට ඈත සිරීපාදේ කන්ද හොඳින් පේනවා. ගමේ සිරිත් විරිත්, ගමේ හැදියාව, ගමේ අයගේ එකමුතුකම සහ ඔවුන්ගේ කතා බහ, භාවිතාකරන වචන, තොවිල්, ගම්මඩු, ගොයම් යායවල්, අපේ ගැණු මිනිස්සුන්ගෙ සීපද, ගොයම් කවි, කටහඬ, ඒ ගමේ බාසාව, ඒ වගේම මරණයක් දුකක් වුනාම ඒ කණගාටුව බෙදා හදා ගැනීම ආදී දේ පුංචි කාලේ ඉඳලම මගේ ජීවිතය හැඩ ගැස්සුවා. ඒ විවිධ චරිත මම ඇස් දෙකින් දැක්කා. රඟපෑම නෙවෙයි, ඒ හැම දෙයක්ම කිසියම් ආකාරයකින් මගේ ලේ වලට මිශ්‍රවෙලා තිබුණා. ඒ තමයි මගේ ජීවිතයේ මූලික ඉගෙනීම. ඒ ගම තමයි මගේ විශ්ව විද්‍යාලය. ඒ නිසා රඟපාන්න කියලා දෙයක් මට තිබුණේ නැහැ. මම පසු කාලෙක තේරුම්ගත්තා සෑම සාර්ථක රංගන ශිල්පියෙකු හෝ ශිල්පිනියකගෙ කුසලතා ගොඩ නැගුණේ ඔහු හෝ ඇයගේ ජීවිතයට ළමා කාලයේ ඉඳලාම එකතුවන අමුද්‍රව්‍ය මත කියලා. ඒ සම්පූර්ණ ඇත්ත. මගේ රඟපෑම් ජීවිතය ගැන ආපහු හැරිලා බලන කොට මට කියන්න තියෙන්නෙත් ඒ දේ තමයි. "

නළු නිළියන් කලාකරුවන් උපතින්ම ඒ හැකියාවන් රැගෙන එනවා විනා ඒවා පසු කලෙක සකස් කරගත හැකි දේවල් යයි සිතන්නට මම මැළිවෙමි. කලාකරුවා සුවිශේෂ කෙනෙකු වන්නේ ඒ නිසා ය. එසේම ඔහු වර්තමානයේ පමණක් නොව ඉතිරිකර යන නිර්මාණවලින් මතු පරම්පරාවල් ද පෝෂණය කරන්නේ ය. හැඩගස්වන්නේය.

ජෝ අබේවික්‍රම යනු අප රටට ලැබී තිබුණු මහඟු දායාදයකි. ඒ කලාකරුවාණන් යළි අප අතරම උපදීවායි! පතමි.

♦ දයා ආනන්ද

## 29-Year-Old Brit -The Youngest Grandfather Ever

## බ්‍රිතාන්‍යයේ ලාබාලම සීයා මෙන්න! වයස 29 යි!



Proud British grandad **Shem Davies** is not even 30 yet and his 14-year-old daughter **Tia** already has a child! Shem had Tia when he was only 15, setting the stage for his daughter to follow in his footsteps. When Shem, who happens to be unemployed at the moment, showed up to the hospital, the staff thought he was the father instead of the grandfather. It's hard to believe in it. See the photos of quit possibly the youngest family in the UK.

The father is actually 15-year-old Jordon, making for a disturbingly immature family. These young parents are part of the more than 35,000 kids under 18 who get pregnant in the UK each year. However, at least half of those kids get an abortion.

**මේ** පින්තූරය දෙස බලන්න. කෙල්ලෙක් අළුත උපන් බිලිඳෙක් තුරුළුකරගෙන සිටී. ඇගේ වයස අවුරුදු 14 කි. ඒ ඇගේ දරුවාය. ළඟම හේත්තු වී ඉන්නේ දරුවාගේ පියාය. ඔහුට වයස 15 කි. ඒ දෙදෙනම තවම පාසැල් ශිෂ්‍යයෝ වෙති. පිටුපස සිටින්නේ කෙල්ලගේ තාත්තා ය. එම තාත්තාට වයස 29 කි. ඒ සමග ඉන්නේ කෙල්ලගේ අම්මාය. ඇයට ද වයස 29 කි. මේ බ්‍රිතාන්‍යයේ ලාබාලම දරු පවුල ය. 29 හැවිරිදි ෂෙම් ඩේවිස් මෙතෙක් බ්‍රිතාන්‍යයේ දුටු ලාබාලම සීයා බව හෙළිවී ඇත.

දරුවා ප්‍රසූත කළාට පසු දියණිය බලන්නට ෂෙම් රෝහලට ආ විට නර්ස්ලා සිතා ඇත්තේ ඔහු දරුවාගේ පියා කියායි. " නෑ මම සීයා " යයි ඔහු කී විට හෙදියෝ එය කොහෙත්ම විස්වාස නොකළහ.

බ්‍රිතාන්‍යයේ වසරකට වයස 18 ට අඩු දැරියන් 35,000 ක් ගැබ්ගනිති. ඒ ගණනින් බාගයකට වඩා ඒ දරුගැබ් ඇති වූ වහාම විනාශකර දමනු ලබති.